WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**15 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

**ක්‍රිස්තියානි ධර්මය I, II**
கிறிஸ்தவம் I, II
Christianity I, II

## ක්‍රිස්තියානි ධර්මය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ගාබ්‍රියෙල් දේවදූතයාගෙන් විශේෂ උපත් පිළිබඳ ශුභ ආරංචි ලැබූ **දෙදෙනා** නම් කර, ඔවුන්ගේ ප්‍රතිචාර මොනවා දැ'යි දක්වන්න.

(ii) "**ගොයම** නම් බහුල ය. **ගොවිහු** විරල ය. එබැවින් මෙහෙකරුවන් එවන ලෙස ගොයමේ හිමියන්ට යාච්ඤා කරන්න."

(a) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කා හට ද?

(b) තද කළු අකුරෙන් යෙදී ඇති පද පැහැදිලි කරන්න.

(iii) (a) 'විද්‍යාවේ යතුර හිමියන්' ලෙස ලූක් සුබසුනේ සඳහන් වන්නේ කවරහු ද?

(b) ඔවුන්ගේ බරපතල වරද ලෙස ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ කුමක් ද?

(iv) ජේසුස් වහන්සේ සේවය කළ සමාජයේ දරුවනට නිසි ගෞරවයක් හා පිළිගැනීමක් ලබාදීමට ක්‍රියා කළ අවස්ථා **දෙකක්** ඉදිරිපත් කරන්න.

(v) "මුළු ඊශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත." ..........

(a) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කවරෙක් පිළිබඳව ද?

(b) එයින් කිතුනු අප ලබන ආදර්ශය කුමක් ද?

(vi) "ඔබගේ ඉඟ පටිය බැඳගන්න, පහන් ද දල්වා තබා ගන්න."

(a) මෙය ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?

(b) එයින් අදහස් කෙරෙන්නේ කුමක් ද?

(vii) (a) ගීතාවලියේ 23 වන ගීතයෙන් බැටළු එඬේරාණන් වශයෙන් දැක්වෙන්නේ කා පිළිබඳව ද?

(b) ජේසුස් වහන්සේ 'යහපත් බැටළු එඬේරා' යන සංකල්පය පරිපූර්ණ කළේ කෙසේ ද?

(viii) "ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න."

(a) ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ අවස්ථාව කුමක් ද?

(b) එයින් ඉදිරිපත් කෙරෙන සත්‍යය කුමක් ද?

(ix) (a) ජෙරුසලමේ මන්ත්‍රණ සභාව කැඳවීමේ අරමුණ කුමක් ද?

(b) එහි නායකත්වය දැරුවේ කවුද?

(x) කිතුනු පවුලක් සාර්ථක ව ගෙනයෑම සඳහා දෙමව්පියන්ගෙන් හා දරුවන්ගෙන් බලාපොරොත්තු වන වගකීම් එක බැගින් ලියන්න.

(ලකුණු 2 × 10 = 20යි)

WWW.OLEVELAPI.COM

**2.** (i) 'මෙසියස්' යන්නෙහි අර්ථය කුමක් ද? ජෙරුසලමේ දේව මාලිගයේ දී ජේසු බිළිඳා මෙසියස් ලෙස හඳුනාගත්තේ කවුරුන් විසින් ද?

(ii) ජේසුස් වහන්සේගේ දෙමව්පියන් එතුමා සම්බන්ධයෙන් ඉටු කළ ජුදෙව් චාරිත්‍ර **තුනක්** ලුහුඬින් ඉදිරිපත් කරන්න.

(iii) ශ්‍රී ලාංකික සමාජය තුළ කිතුනු ආගමික චාරිත්‍ර හා කිතුනු අනන්‍යතාව රැකගෙන අන් අය ආකර්ෂණය වන පරිදි ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද?

(ලකුණු 10යි)

**3.** (i) ජේසුස් වහන්සේ සිය සේවය ඇරඹුයේ කුමන නගරයෙන් ද? සිය සේවය ගැන ධර්මශාලාවේ දී උන් වහන්සේ කියැවූයේ කුමන දිවැසිවර ග්‍රන්ථයෙන් ද?

(ii) ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳ ව උන් වහන්සේ කියැවූ පාඨයේ අඩංගු වූ විශේෂිත කරුණු, උන් වහන්සේගේ සේවයේ දී ඉටු කළ අන්දම උදාහරණ සහිත ව දක්වන්න.

(iii) ඉහත (ii) ට අදාළ ව ඔබ විසින් දක්වන ලද, වත්මන් සමාජයේ ද දක්නට ලැබෙන එවැනි අවස්ථා ඉදිරිපත් කර, කිතුනුවන් ලෙස අපට ගත හැකි ක්‍රියාමාර්ග කවරේ දැ'යි පහදන්න.

(ලකුණු 10යි)

[ හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

4. මානව හිමිකම් ගිලිහී ගොස් ඇති බව නිතර අපට දැනගන්නට ලැබේ.

 (i) ජේසුස් වහන්සේ මෙලොව සේවය කළ කාලයේ දී හිංසනයට හා පීඩනයට ලක්වී සිටි ජන කොටස් **දෙකක්** ගැන ලුහුඬින් පැහැදිලි කරන්න.

 (ii) ජේසුස් වහන්සේ එබඳු ජන කොටස් වෙනුවෙන් ක්‍රියාකර, ඔවුනට සමාජ හිමිකම් ලබා දුන් අවස්ථා **තුනක්** සඳහන් කරන්න.

 (iii) ශ්‍රී ලාංකික ජන සමාජයේ ජනතාව මුහුණපාන හිංසන හා පීඩන **පහක්** සඳහන් කර, එබඳු අවස්ථාවල කිතුනු ප්‍රතිචාරය කෙසේ විය යුතු දැ'යි පහදන්න.

(ලකුණු 10යි)

5. (i) ශුද්ධ වූ පාවුල්තුමා රෝමයට සිරකරුවකු ලෙස ගිය ගමනේ දී මුහුණ දුන් අභියෝග **දෙකක්** ලුහුඬින් ලියන්න.

 (ii) අර්බුදය මැද පාවුල්තුමා ආදර්ශමත් නායකත්වයක් දුන් අන්දම පහදන්න.

 (iii) පාවුල්තුමාගේ එම ආදර්ශය අනුව කිතුනු අප අර්බුදකාරී තත්ත්ව ඉදිරියේ කෙසේ ක්‍රියා කළ යුතු දැ'යි විස්තර කරන්න.

(ලකුණු 10යි)

6. (i) ජේසුස් වහන්සේ විසින් සීමොන් පේදුරු සහ මතෙව් කැඳවූ අවස්ථාවේ දී ඔවුන් දැක්වූ ප්‍රතිචාර කෙසේ වී ද?

 (ii) ජේසුස් වහන්සේ එදා ජුදා සමාජ තත්ත්වය ඉක්මවා ශ්‍රාවකයන් කැඳවීමේ හා එහි සංයුතියේ විශේෂිත වූ ලක්ෂණ **තුනක්** ඉදිරිපත් කරන්න.

 (iii) වත්මන් සමාජය උදෙසා කිතුනු අනුගාමිකත්වය දරන අපගෙන් ජේසුස් වහන්සේ බලාපොරොත්තු වන්නේ මොනවා දැ'යි පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

7. (i) පරිසිවරු ජුදා සමාජයේ කෙබඳු තත්ත්වයක් දැරුවේ ද? ඔවුන්ගේ ආගමික කටයුතුවල මධ්‍යස්ථානයක් වූයේ කුමක් ද?

 (ii) සීමොන් පරිසිවරයාගේ නිවසේ දී ජේසුස් වහන්සේ පිළිගැනීමේ දී පැහැර හරින ලද ජුදා චාරිත්‍ර **තුනක්** ලියන්න.

 (iii) පරිසිවරුන්ගේ පුහු ධාර්මිකභාවය හෙළා දකිමින් ජේසුස් වහන්සේ ක්‍රියා කළ අන්දම අනුගමනය කරමින් කිතුනු අප සමාජයේ ක්‍රියා කළ යුතු ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....